ඇන්ටන් ජූඩ් පිළිබඳ මතක සටහන්

# අපි නාට්‍යයක් වෙනස් කළා

ඇන්ටන් ජූඩ් මා සමගින් ප්‍රසිද්ධ නාට්‍ය වේදිකාවට එක්වන්නේ රත්මලානේ කම්කරු සෙවණ හරහා එකට ය. ඒ වන විට මා පාසල් වේදිකාවේ රඟ පා තිබුණ අතර ජූඩ් සහ ජගත් චන්ද්‍රසිරි එක් දිනෙක මා ද කැටුව කම්කරු සෙවණට ගියේ ය. මේ අසූව දශකයේ මුළ ය. ජූඩ් ඒ වන විටත් දක්ෂ ලෙස ගායනා කළ අතර ඔහුගේ පියා වූ ගෝමස් අංකල් කම්කරු සෙවණේ සේවය කළේ ය.

මේ කාලයේදී විජිත ගුණරත්න "දැති කියත" නමින් වේදිකා නාට්‍යයක් නිෂ්පාදනය කළේ ය. එහි සංගීතය නිර්මාණය කළේ ඔස්ටින් මුණසිංහ මහතාය. එහි කම්කරු පිරිසේ එක් අයෙක් ලෙස රඟපාන්නට ජූඩ් ට අවස්ථාව ලැබුණි. රඟපෑමේ අවස්ථාවක් නොලැබුණත් වේදිකාවේ පසු පසට වී අත් උදව් දීමෙන් මම සෑහීමට පත්වුණෙමි. මේ වේදිකා නාට්‍යයේ තරුපති මුණසිංහ නම් වූ අවුරුදු පහක් හයක් වයස දරුවාද කම්කරුවකුගේ පුතෙක් ලෙස රඟපෑවේ ය.

කම්කරු සෙවණේ වීදි නාට්‍ය කණ්ඩායමක් තිබුණි. ඇන්ටන් ජූඩ් සහ ජගත් චන්ද්‍රසිරි සමගින් මම මේ වීදි නාට්‍ය කණ්ඩායමට එක්වුණෙමි. අසූ තුනේ කලබලයෙන් පසුව ජාතිවාදී අරගලයෙන් මිය ගිය ද්‍රවිඩ පුද්ගලයන් අවතාර සේ පැමිණ කතා කරන්නා සේ එක් වීදි නාට්‍යයක් නිර්මාණය විය. අපි තිදෙනාම මේ වීදි නාට්‍යයේ රඟපෑවෙමු. දඟකාර වයසේ සිටි ජූඩ් සහ මම එක්තරා දිනෙක අපට හිතෙන පරිදි වීදි නාට්‍යය වෙනස් කළෙමු. මම ඒ අනුව වීදි නාට්‍යය රඟ පාද්දී මගේ චරිතය එල්ටීටීඊ ප්‍රහාරයකින් මිය ගිය සොල්දාදුවකු ලෙස වෙනස් කර රඟපෑවෙමි. මේ නොසන්ඩාල වැඩේ නිසා නිෂ්පාදකවරයාගෙන් හොඳ හැටි බැණුම් ප්‍රහාරයක් සමග මම වීදි නාට්‍ය කණ්ඩායමෙන් එළියට විසි කර දමනු ලැබුවෙමි.

මට ද අමතකව සිටි මේ කතාව මට සිහිපත් කර දෙනු ලැබුවේ පසුගියදාක මෙල්බන් නුවරට පැමිණි විටෙක ඇන්ටන් ජූඩ් මගේ හිතවතා විසින්ම ය.

එහෙත් ඒ වතාවේදී අපට හමුවන්නට ඉඩක් නොලැබුණි. "කොහෙ එන්ඩද මචං.. මේ අය එක එක වැඩ සටහන් යොදාගෙනනෙ.." අපේ නිවසට සවසක එන්නැයි මා ආරාධනා කළ විට ජූඩ් කීවේ සිනාසෙමින් ය. ජූඩ් සිනාසෙමින් කීවද මෙය එක්තරා ආකාරයක ඛේදවාචකයකි. විවිධ සංචාර සඳහා මෙරටට පැමිණෙන අපේ කලාකරුවන්ට ජීවත්වන්නට සිදුවන්නේ ප්‍රාණ ඇපකරුවන් සේ ය.



සංවිධායකයෝ කලාකරුවන්ගේ අයිතිකරුවෝ වෙති. කලාකරුවන්ට තමන් කැමති කිසිවක් කරන්නට යන්තමින් හෝ නිදහසක් නැත. මෙවන් තත්වයක් පවතින්නේ ඔස්ට්‍රේලියාවේ පමණක් බව ලෝකයේ බොහෝ රටවල සංචාරය කර ඇති මම අත්දැකීමෙන් දනිමි. මෙහි සංචාරකයන් සිතන්නේ ඔවුන් මුදල් වියදම් කර ගෙන්වූ බැවින් කලාකරු-වන් ඔවුන්ගේ යටත් වැසියන් සේ සිටිය යුතුයයි කියා ය. කලාකරුවන් ජනප්‍රිය වන්නට පෙර ඔවුන් ගෙවා ආ අතීතයක් ඇත. ඒ කටුක අතීතයේදී එවුන් හා එක්ව සිටි සහෝදර කලාකරුවන් හමුවී පසුගිය අත්දැකීම් බෙදා හදා ගැනීමේ අහිංසක ආසාවක් මේ සියලු කලාකරුවන්ට ඇත. ඒ ආසාවට වැට බැඳීම නොකළ යුත්තකැයි මම සිතමි. විදේශයකදී පැරණි හිත මිතුරන් හා එක්වන්නට සුලුවෙන් හෝ ඉඩක් කලාකරුවන්ට ලබාදෙන්නැයි ඔස්ට්‍රේලියාවේ දර්ශන සංවිධායකයන්ගෙන් ඉල්ලා සිටින්නට මා කැමති වන්නේ මා මේ අත්දැකීම හොඳ හැටි විඳ ඇති නිසා ය.

මේ ප්‍රවණතාවෙන් මිදුන එකම කණ්ඩායම ලක්මැදුරේ ශාන්ත සුබසිංහ සමන් රන්වල ඇතුළු කණ්ඩායම පමණකි. කලාකරුවන් හිත්පිත් ඇති මිනිසුන් බව ඔවුන් හඳුනාගෙන ඇති බව "සුබ සහ යස" කණ්ඩායම මෙල්බන් නුවරට පැමිණි අවස්ථාවේ ඔවුහු පෙන්වා දුන් හ. සුබ යස කණ්ඩායම සහ අප අතර ඇති මිත්‍රත්වය දන්නා මේ පිරිස ස්වෙච්ඡාවෙන්ම අපට හමුවන්නට අවස්ථාවක් ලබා දුන් ආකාරය මගේ සිතේ නොමැකෙණ ලෙස තැන්පත්ව ඇත. මගේ හිත



ශ්‍රීනාත් මද්දුමගේ

මිත්‍ර ඇන්ටන් ජූඩ් මෙල්බන් නුවරදී හමුවන්නට මට අවස්ථාවක් නොලැබුණේ තම හිතමිතුරන් හමුවීමටවත් කලාකරුවන්ට ඉඩක් නොලැබෙන අවාසනාවන්ත වාතාවරණය නිසා ය. ඇන්ටන් ජූඩ් හමුවීමේ අවස්ථාව දෙවතාවක්ම මගහැරීම මට වේදනාවකි.

කම්කරු සෙවණේ කලබැගෑනියෙන් පසු මට රූපවාහිනියේ කතන්දර පිටුවේ රඟපාන්නට අවස්ථාව උදා විය. මම එහි ජනප්‍රිය චරිතයක් වූයෙමි. මම කතන්දර පිටුව කළ ශ්‍රීමතී ලියනගේ මහත්මියට ඇන්ටන් ජූඩ් හඳුන්වා දුන්නෙමි. ඒ අනුව අපි රූපවාහිනියේ "පුංචි රාළ" ටෙලි නාට්‍යයේ එකට රඟපෑවෙමු.

දක්ෂ ගායකයකු වූ ඇන්ටන් ජූඩ් සිය ගායන දක්ෂතා පෙන්වමින් පරාක්‍රම නිරිඇල්ලගේ " සෙක්කුව" දෙවන නිෂ්පාදනයේදී පූරක ගේ චරිතය කළේ ය. ජූඩ් රංග වේදිකාවේ බොහෝ දුර ගිය නමුත් ඔහු ජනප්‍රිය වූයේ එක් රැයකින් එක් ගීතයක් නිසා ය. ඒ "සකිසඳ එළියස්" ටෙලි නාට්‍යයේ "උණ පුරුකේ බලු වලිගේ (අයිස් අප්පා ගුණ්ඩු)" ගීතයෙනි. මේ ගීතයේ තනුව නිර්මාණය කළේ තරුපති මුණසිංහ බව බොහෝ දෙනාට අමතක ය.

ඇන්ටන් ජූඩ් නම් වන නිහතමානී ආදර්ශමත් කලාකරුවා නිහඬවම යන්නට ගියේ ය. ජීවත් වන අපි ඔහු නැති දුක වාවා ගන්නේ කෙසේදැයි නොදැන සුසුම් හෙළන්නෙමු.

WONDERLAND CAFE
ඉදිආප්ප (String Hoppers)
සුදු / රතු සහල් පිටි ඉදිආප්ප
උත්සව, ප්‍රියසම්භාෂණ සහ විශේෂ අවස්ථා සඳහා
White / Red Rice Flour String Hoppers
For Parties, Functions & Special Occasions
SPECIAL OFFER*
25 String Hoppers for only
$3.25
Valid till 31 May 2012
Best Quality White & Red Rice Flour String Hoppers ideal for Party Catering and Functions
Please order your String Hoppers in advance to avoid disappointment
* Conditions and Minimum Order Quantities Apply
Tel: (03) 9701 0005
Mobile : 0416 457 359
WONDERLAND CAFE
www.wonderlandcafe.com.au
4/52 Outlook Drive, Dandenong North, Vic 3175
(Melway Ref. 81 E9)